# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,104—1960 අප්‍රේල් 9 වැනි සෙනසුරාදා—9.4.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී. 299 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය**

**හාල්**

### 1950 අංක 29 දරණ මිල පාලන පනත

**නියෝගය**

මිල (ආහාර) පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1959 ජූනි 13 වෙනි දින හා 11,773 වෙනි අංකය දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1959 ජූනි 12 වෙනි දිනය හා සී. 286 වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය 1960 අප්‍රේල් 11 වෙනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(ii) මීට යාකර ඇති උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිල 1960 අප්‍රේල් 11 වෙනිදා සිට රාත්තලක් සිල්ලරට විකිණිය හැකි වැඩිම මිල වශයෙන් ද, එම උපලේඛනයේම 1 වෙනි තීරයේ සඳහන් වර්ගයට හා ශ්‍රේණියට අයත් කිසියම් හාලක් කොළඹ නගරයේ නාගරික සීමා තුළ එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් වර්ගයට සහ ශ්‍රේණියට අයත් කිසියම් හාලක් වෙන කිසියම් දැයක් සමග කළවම් කොට නොවිකිණිය යුතු බවද,

(iv) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසියම් හාලක් විකුණන කල්හි, එය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිලක් වෙතොත් එම මිල, එකී උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් වැඩිම සිල්ලර මිලෙහි අන්තර් ගතවන බවද,

(v) මෙම නියෝගයෙහි කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් හැඟවෙන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද මෙම නියෝගයෙන් නියම කරමි.

1960 අප්‍රේල් මස 9 වෙනි දින පෙ. ව. 11.30 ට කොළඹ දී අත්සන් තබන ලදී.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
මිල (ආහාර) පාලක.

### උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය |
|---|---|
| වර්ගය සහ ශ්‍රේණිය | කොළඹ නාගරික සීමාතුළ සිල්ලරට විකිණීමේදී රාත්තලක වැඩිම මිල. |
| සියළුම වර්ගවලට අයත් හාල්. | ශත 12½ යි. |


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

417—ජේ. ඇන්.ආර් 9148—4,350 (4/60)